**යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රජා-මූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2015**

---

යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රජා-මූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 01 දින එළඹි අංක ජේඑෆ්පීආර් 9154 එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ 11(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව, වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව හා කරච්චි ප්‍රාදේශීය සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ග්‍රාමීය ප්‍රජාව හා අභ්‍යන්තරිකව අවතැන් වී නැවත පැමිණෙන ජනතාව සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම මඟින් ඔවුන්ගේ දිළිඳුකම අඩුකරලීම හා පසු ගැටුම් ජීවන තත්ත්වය නඟා සිටුවීමයි. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 268.26 කට සමාන එජඩො මිලියන 2.42 ක් වන අතර මුළු පිරිවැයෙන් සියයට 83 ක් හෙවත් රු.මිලියන 221.70 කට සමාන එජඩො මිලියන 2 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් දිළිඳුකම අඩු කිරීම සඳහා වන ජපන් අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. මුළු පිරිවැයෙන් සියයට 11 ක් හෙවත් රු.මිලියන 28.82 කට සමාන එජඩො මිලියන 0.26 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබූ අතර රු.මිලියන 17.74 කට සමාන එජඩො මිලියන 0.16 ක ශේෂය හෙවත් මුළු පිරිවැයෙන් සියයට 6 ක් ප්‍රජා දායකත්වය මඟින් මූල්‍යයනය කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 අගෝස්තු 01 දින ආරම්භ කරන ලද අතර 2015 ජූනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය 2015 සැප්තැම්බර් 30 දක්වා පමණක් දීර්ඝ කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට

අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව, උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමට අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද, යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව, සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2016 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 ජූලි 28 දිනදීය.

### 2.2.2 නොසැසඳූ ශේෂ

පහත නිරීක්ෂණයන් කරන ලදි.

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කෙරීගෙන යන සිවිල් වැඩ වටිනාකම රු.මිලියන 2.6 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එය රු.මිලියන 275.4 ක් ලෙස දක්වා තිබුණි. එහෙත් රු.මිලියන 272.8 ක වෙනස සැසඳීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, 2015 වර්ෂය සඳහා විදේශ ප්‍රදාන සංරචකය යටතේ දැක්වෙන ව්‍යාපෘති වියදම රු.මිලියන 31.8 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 122.6 ක් විය. රු.මිලියන 90.8 ක වෙනස සසඳා නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 2.00 | 221.70 | 125.00 | 0.91 | 124.60 | 1.95 | 259.80 |
| ශ්‍රීලංර | 0.26 | 28.82 | 12.00 | 0.08 | 11.20 | 0.25 | 32.89 |
| ප්‍රජා දායකත්වය | 0.16 | 17.74 | - | - | - | - | - |
| | 2.42 | 268.26 | 137.00 | 0.99 | 135.80 | 2.20 | 292.69 |

ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ (Grant Implementation Manual ) රු.මිලියන 17.74 කට සමාන එජඩො මිලියන 0.16 ක් වටිනා ප්‍රජා දායකත්වය හඳුනා ගෙන තිබුණද, ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ප්‍රතිලාභීන් විසින් කරන ලද දායකත්වයේ වටිනාකම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-------------------

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 99 ක් හා සියයට 75 ක් ලෙස වාර්තා වී තිබුණි. එබැවින් යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල 2015 දෙසැම්බර් 31 අවසානයට ගෘහ ඒකක 2500 ක් සඳහා ව්‍යාපෘතිය විසින් ආරක්ෂිත පානීය ජලය සපයා තිබූ අතර ගෘහ ඒකක 645 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් සපයා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරන ලදි.

(අ) 2014 නොවැම්බර් මාසයේදී රු.මිලියන 55.5 ක පිරිවැයකට පිරිනමන ලද මුහුදු ජලය ප්‍රතිවර්තන අවශෝෂණ පිරියත ( Sea Water Reverse Osmosis Plant ) ඉදිකිරීම සඳහා කාර්යයන් නිම කර 2015 ජුනි 30 දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදී තිබුණි. පිරියත මඟින් ගෘහ ඒකක 400 කට ජල සම්බන්ධතා සැපයීම සඳහා ව්‍යාපෘතිය ඉලක්ක කර තිබුණි. කෙසේ වුවද, 2016 සැප්තැම්බර් 30 දිනට ගෘහ ඒකක 142 කට පමණක් ජල සම්බන්ධතා සපයා තිබුණි. පිරියත මඟින් දිනකට ඝන මීටර් 100 ක් නිෂ්පාදනය කිරීමට හැකි බව සඳහන් කර තිබුණද, 2016 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා වාර්තා කරන ලද තථ්‍ය නිෂ්පාදනය දිනකට ඝන මීටර් 21-28 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ලැබුණු තොරතුරු අනුව, මාදගල්, ශාන්තායි, වඩ්ඩකච්චි , අක්කරායන් හා ඉයක්කච්චි ප්‍රදේශවල ව්‍යාපෘතිය විසින් ප්‍රජා මූල සංවිධාන ඇති කර රු.මිලියන 37.8 ක මුදලක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ඒ සඳහා වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරන ලදි.

(i) ඇති කරන ලද ප්‍රජා මූල සංවිධාන 5 අතුරින් එක් ප්‍රජා මූල සංවිධානයක් පමණක් 2016 ඔක්තෝබර් 31 දිනට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවෙන් තාක්ෂණික, මූල්‍ය, තිරසාරත්වය හා කාර්යක්ෂමතාවය සඳහා සහාය ලබාගැනීමට ලියාපදිංචි වී ඇති බව නිරීක්ෂණය විය.

(ii) ඉහත සඳහන් ප්‍රජා මූල සංවිධානවල ජල සැපයුම් පද්ධති සඳහා ජල භූ විද්‍යා වාර්තා අනුව, ජලය පිළිබඳ ගුණාත්මක තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා මාසයකට වරක් සිදුකළ යුතු සම්පූර්ණ රසායනික පරීක්ෂණයක් හා බැක්ටීරියා පිළිබඳ පරීක්ෂණ සිදුකර නොතිබුණි.

(ඇ) ලබාගත හැකිවූ තොරතුරු අනුව, සරප්පිඩ්ඩි හි නව ළිඳක් ඉදිකිරීම 2015 වර්ෂයේදී ආරම්භ කර අතරමඟ අත්හැර දමා තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.597,065 ක අත්තිකාරම් ගෙවීම අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**3.4 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම**

**-------------------------------------**

ව්‍යාපෘති කටයුතු 2015 සැප්තැම්බර් 30 දිනට අවසන් කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනට වසා දැමීමේ ගිණුම් පිළියෙල කිරීම සඳහා හැකි වන පරිදි වගකිව යුතු අධිකාරින්ට වත්කම් භාරදීමට හා වගකීම් මාරු කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි.